සමාන්තර විද්‍යා අධ්‍යයන අංශය
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය
රාජගිරිය ශ්‍රී ලංකාව

UNIT OF ALLIED SCIENCES
INSTITUTE OF INDIGENOUS MEDICINE
RAJAGIRIYA SRI LANKA
UNIVERSITY OF COLOMBO

---

ගරු ස්වාමින්වහන්ස / පූජකතුමනි,
මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි,

**<u>වෛද්‍ය අධ්‍යාපනය හා වෛද්‍ය පර්යේෂණ සඳහා මෘත දේහ පරිත්‍යාග කිරීමේදී අනුගමනය කලයුතු ක්‍රියා පිළිවෙත්</u>**

මරණින් පසුව ඔබගේ දේහය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය වෙත ප්‍රදානය කිරීම සඳහා ඔබ තුළ ඇති කැමැත්ත ඉතා අගය කොට සලකමු. මරණින් පසු මෘත දේහයේ භාරකාරත්වය ඥාතීන් / භාරකරුවන් සතු වේ. එම නිසා ඔබ ඒ සඳහා, ඥාතීන් පහත සඳහන් උපදෙස් පරිදි දැනුවත් කර තිබීම වැදගත් වේ.

1. මෘත දේහයක් පරිත්‍යාග කළ හැක්කේ **<u>ස්වභාවික මරණයක් නම් පමණක්</u>** වන අතර පහත සඳහන් ආකාරයේ මෘත දේහ පරිත්‍යාග කල නොහැක.
   - මිය යන විට දියවැඩියාව, පිළිකා, මෙනින්ජි ප්‍රදාහය (Meningitis), ක්ෂය රෝගය, සෙංගමාලය, එච්.අයි.වී / ඒඩ්ස්, දද, කුෂ්ඨ වැනි රෝග වැළදී තිබීම.
   - ඇස් හැර අනෙකුත් අවයව ඉවත් කළ හෝ පරිත්‍යාග කල මෘත දේහ.
   - මරණින් පසු අවශ්‍ය පරිදි එම්බාම් (ස්වාරක්ෂණය) කිරීමකින් තොරව පැය 18ක් කල් ඉකුත් වූ මෘත දේහ.
   - ප්‍රධාන ශල්‍යකර්මවලට භාජනය කල මෘත දේහ.
   - ඇඳ වණ හෝ මෑතකදී සිදු කළ ශල්‍යකර්ම නිසා ඇති වූ විවෘත තුවාල ඇති දේහ.

2.

2.1. සමාන්තර විද්‍යා අධ්‍යයන අංශයට භාරදීමට ප්‍රථම මෘත දේහය අනිවාර්යයෙන්ම එම්බාම් කල යුතු වේ. එම්බාම් කළ යුත්තේ පාදයේ කලවා පෙදෙසේ ඉහල කොටසේ ඉදිරියෙන් පිහිටි ඌර්ව ධමනිය තුළින් ස්වාරක්ෂක තරලය (40% ෆෝමලින් ) ලීටර් 5ක් ශරීරයට ඇතුළු කිරීමෙනි.

2.2. ඉහත කී ආකාරයට හැර අන් කිසිදු ආකාරයකින් එම්බාම් කර භාරදෙන මෘත දේහ භාරගනු නොලැබේ.

2.3. අක්ෂිදාන සංගමයට මියගිය තැනැත්තාගේ ඇස් දන් දීම ගැන විරුද්ධත්වයක් නොමැත. (ශරීරයේ වෙනත් කොටසක් කැපීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.)

3.

3.1. මරණය සිදු වූ වහාම ඒ බව ඥාතීන් / භාරකරුවන් විසින් පහත සඳහන් නිලධාරීන්ගෙන් එක් අයකු දැනුවත් කර භාරදීම සඳහා අවශ්‍ය නිසි උපදෙස් ලබා ගත යුතුය.
   - ජී.එස්.නන්දන මයා (තාක්ෂණ නිලධාරී) 074034284
   - ඉනේෂා රාජපක්ෂ මිය (කළමණාකාර සහකාර) 0710927559
   - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අධ්‍යයන අංශ ප්‍රධානී වෛද්‍ය රේණුකා වික්‍රමසිංහ මහත්මිය 0713032277

- දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය 0112694308 සහ 0112692385
  මෙම දුරකථන අංක මගින් සමාන්තර විද්‍යා අධ්‍යයන අංශය ලබා ගන්න.

3. **දේහය භාරදීමට පෙර ඉහත දක්වා ඇති දුරකථන අංක මගින් අධ්‍යයන අංශය වෙත සතියේ දිනවල පෙ.ව 8.30 ත් ප.ව 4.00 ත් අතර ඇමතුමක් ලබාගැනීම අවශ්‍ය අතර අධ්‍යයන අංශයේ අවශ්‍යතාවය පරිදි දේහය භාරගැනීමට හැකිබව සනාථ කර ගැනීම අත්‍යවශ්‍ය බැවි කරුණාවෙන් සලකන්න. මෘත ශරීර භාරගනු ලබන්නේ සතියේ දිනවල (රජයේ නිවාඩු හැර) පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා පමණි. (සෙනසුරාදා හා ඉරිදා දිනයන්හි දී මෘත ශරීර භාර ගනු නොලබන බව කරුණාවෙන් සලකන්න.**

3.3 මෘතදේහ බහාලන ටැංකිවල ඉඩකඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හි දී සමාන්තර විද්‍යා අධ්‍යයන අංශය විසින් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණ ද අත්‍යවශ්‍ය ප්‍රමාණයට පමණක් මෘත දේහ භාර ගන්නා බව කරුණාවෙන් සලකන්න.

3.4. මෘත දේහය වෛද්‍ය ආයතනයට භාර දීමේදී අනිවාර්යයෙන් සැපයිය යුතු ලිපි ලේඛණ,

- **<u>මරණය ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපත හා සහතික කල ජායා පිටපතක්. සහතිකය නොමැතිව කිසිදු හේතුවක් මත මෘත දේහ භාරගනු නොලැබේ.</u>**
- **දායකයාගේ ජාතික හැදුනුම්පතෙහි මුල්පිටපත හා සහතික කල ජායා පිටපතක්.**
- **ඥාතියාගේ / භාරකරුගේ ජාතික හැදුනුම්පතෙහි මුල් පිටපත හා සහතික කළ ජායා පිටපතක්**
- **මෘත ශරීර භාරදීමේ පොරොන්දු පත්‍රයේ පිටපත.**
- **මරණය ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපත භාරදීම අනිවාර්ය වන අතර එය නැවත භාර දෙනු නොලැබේ.)**

3.5 මෘත දේහයක් පරිත්‍යාග කිරීමට පැමිණෙන පුද්ගලයන් විසින් සැලකිලිමත් විය යුතු අනෙකුත් කරුණු.

- මෘත දේහය භාර ඥාති හිතමිත්‍රාදීන් ආයතනයේ සහ අධ්‍යයන අංශයේ අධ්‍යයන කටයුතු වලට බාධා නොවන පරිදි කටයුතු කළ යුතු අතර දේහය සමග ආයතන භූමියට ඇතුළුවිය හැක්කේ උපරිම 06 දෙනෙකුට පමණක් බව සැලකිය යුතු අතර මෘත දේහය භාරගන්නා අවසන් තීරණය අධ්‍යයන අංශ ප්‍රධාන සතු බව කරුණාවෙන් සලකන්න.
- දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය විසින් ප්‍රවාහන පහසුකම් හෝ වියදම් සපයනු නොලැබේ.
- දේශීය වෙද්‍ය විද්‍යා ආයතනය තුළ ආගමික හෝ වෙනයම් උත්සවයක් පැවැත්වීමට අවසර නොලැබේ.
- ඥාතීන්ගේ/ භාරකරුගේ ඉල්ලීම පරිදි වෛද්‍ය විද්‍යා ආයතනය තුලදී දායකයාගේ දේහයෙන් සාදනු ලබන ඇට සැකිල්ල හෝ ඇටසැකිල්ලේ කොටස් පිළියෙල කර දෙනු නොලැබේ.

4. **මෘත දේහ භාරදීම සඳහා ජීවත්ව සිටියදී කැමැත්ත ප්‍රකාශ කිරීමේ සහතිකය අධ්‍යයන අංශය වෙතින් නිකුත් කළද, මෘත දේහය භාරගැනීමේ අවසාන තීරණය එම අවස්ථාව වන විට පවතින තත්ව යටතේ සමාන්තර විද්‍යා අධ්‍යයන අංශ ප්‍රධානි ඇතුළු කාර්ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර ලියාපදිංචි වූ පමණින් එම දේහයන් භාර ගැනීමට අධ්‍යයනාංශය බැඳී නොසිටින බව කරුණාවෙන් සලකන්න.**

අධ්‍යයන අංශ ප්‍රධානි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය එම්.ආර්.එම්. වික්‍රමසිංහ,
සමාන්තර විද්‍යා අධ්‍යයන අංශය,
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,
රාජගිරිය.

| | |
|---|---|
| සමාන්තර විද්‍යා අධ්‍යයන අංශය | UNIT OF ALLIED SCIENCES |
| දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | INSTITUTE OF INDIGENOUS MEDICINE |
| කොළඹ විශ්ව විද්‍යාලය | RAJAGIRIYA SRI LANKA |
| රාජගිරිය ශ්‍රී ලංකාව | UNIVERSITY OF COLOMBO |

---

## මෘත දේහ පරිත්‍යාග කිරීම සඳහා අයදුම්පත

**01. දායකයාගේ විස්තර**

1.1 සම්පූර්ණ නම :..........................................................................................
..........................................................................................

1.2 ලිපිනය :..........................................................................................

1.3 ජා.හැ.අංකය :..........................................................................................

1.4 වයස :..........................................................................................

1.5 දුරකථන අංක : 1.................................................... 2....................................................

1.6 ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී / පුරුෂ

1.7 ශල්‍යකර්මයකට භාජනය වී ඇත්නම් ඒ පිළිබඳ විස්තර :.......................................................................................
..........................................................................................

1.8 පහත දැක්වෙන කුමන හෝ රෝගයකින් ඔබ පසුවන්නේද?

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| පිළිකා | ☐ | මෙනින්ජි ප්‍රදාහය | ☐ | ක්ෂය රෝගය | ☐ | සෙංගමාලය | ☐ |
| එච්.අයි.වී /ඒඩ්ස් | ☐ | දද/ කුෂ්ට | ☐ | දියවැඩියාව | ☐ | | |

වෙනත්..........................................................................................

**02. දායකයාගේ ආසන්න ඥාතියා / භාරකරුගේ විස්තර**

2.1 සම්පූර්ණ නම :..........................................................................................
..........................................................................................

2.2 ලිපිනය : ..........................................................................................

2.3 ජා.හැ. අංකය :..........................................................................................

2.4 දායකයාට ඇති ඥාති සම්බන්ධතාවය :..........................................................................................

2.5 දුරකථන අංක : 1....................................................2....................................................

මා මිය යාමෙන් පසුව මාගේ මෘත දේහය වෛද්‍ය අධ්‍යාපනය සහ වෛද්‍ය පර්යේෂණ සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ සමාන්තර විද්‍යා අධ්‍යනාංශයට පරිත්‍යාග කිරීමට කැමැත්ත මෙයින් ප්‍රකාශ කර සිටිමි.
මේ සම්බන්ධයෙන් දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ උපදෙස් පත්‍රිකාවේ දක්වා ඇති උපදෙස් අනුව කටයුතු කරන බවද මෙයින් ප්‍රකාශ කරමි.

මෙයට විශ්වාසී,

.................................................. ..................................................
දායකයාගේ අත්සන දිනය

**සැලකිය යුතුයි :**

01. අයදුම්පතෙහි පිටපතක් ඔබගේ ඥාතියෙකු / භාරකාරයෙකු භාරයෙහි තැබිය යුතු අතර, මෘත දේහය පරිත්‍යාග කිරීමේදී අදාළ අයදුම්පතෙහි පිටපත සමග දේහය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය වෙත භාර දිය යුතුය.

02. මෘත දේහ පරිත්‍යාග කිරීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ අධ්‍යයන අංශයේ ලියාපදිංචි වී සිටිය ද අධ්‍යයන අංශයෙන් නිකුත් කළ උපදෙස් පත්‍රිකාවේ කරුණු සම්පූර්ණවේ නම් පමණක් දේහය භාරගන්නා බව කරුණාවෙන් සලකන්න.

03. අක්ෂි දන් දෙන්නේ නම්, මෘත දේහය සමාන්තර විද්‍යා අධ්‍යනාංශයට භාර දීමට පෙර අක්ෂිදාන සංගමයට මියගිය තැනැත්තාගේ ඇස් දන් දීම සිදු කළ යුතුය.

04. **මෘත දේහ භාරදීම සඳහා ජීවත්ව සිටියදී කැමැත්ත ප්‍රකාශ කිරීමේ සහතිකය අධ්‍යයන අංශය වෙතින් නිකුත් කළද, අනිවාර්යෙන් දේහය භාරගැනීමේ අවසාන තීරණය එම අවස්ථාව වන විට පවතින තත්ව යටතේ සමාන්තර විද්‍යා අධ්‍යයන අංශ ප්‍රධානී ඇතුළු කාර්ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර ලියාපදිංචි වූ පමණින් එම දේහයන් භාර ගැනීමට අධ්‍යයනාංශය බැඳී නොසිටින බව කරුණාවෙන් සලකන්න.**

අධ්‍යයන අංශ ප්‍රධානී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය එම්.ආර්.එම්. වික්‍රමසිංහ,
සමාන්තර විද්‍යා අධ්‍යයන අංශය,
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,
රාජගිරිය.